# චතාරික සමයේ තුන්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ජෙරමියා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෙරමියා 7 : 23 – 28

**මේ ජනතාව තම සමිඳාණන්ගේ හඬට සවන් නොදෙන ජාතියකි.**

එහෙත් මා ඔවුන්ට අණ කළේ, “මාගේ හඬට කීකරු වන්න. එවිට මම නුඹලාගේ දෙවියන් වහන්සේ වන්නෙමි. නුඹලා ද මාගේ සෙනඟ වන්නහු ය. නුඹලාට ශුභ සිද්ධ වන පිණිස මා නුඹලාට අණ කරන මාර්ගය අනුව හැසිරෙන්න කියාය. එහෙත් ඔව්හු සවන් දෙන්නේ වත් කීකරු වන්නේ වත් නැතිව හිතුමතේ ද මුරණ්ඩු සිත්වල දුෂ්ඨ අදහස් අනුව ද හැසිරෙමින් ඉදිරියට යෑම වෙනුවට පසුබැස ගියහ. නුඹලාගේ පියවරුන් මිසර දේශයෙන් පිටත්ව පැමිණි දා සිට අද දක්වා නොකඩවම මම මාගේ සේවකයන් වූ දිවැසිවරුන් ඔවුන් වෙත එවීමි. එහෙත් ඔවුන් සවන් දුන්නේ වත් කන් යොමු කළේ වත් නැත. ඒ වෙනුවට ඔව්හු මුරණ්ඩු වී ඔවුන්ගේ පියවරුන්ටත් වඩා නපුරුකම් කළෝය.

ජෙරමියා නුඹ මේ සියලු වචන ඔවුන්ට කතා කර කියන නමුත්, ඔව්හු නුඹලාට සවන් නොදෙන්නෝය. නුඹ ඔවුන්ට අඬගසන නමුත් ඔව්හු නුඹට උත්තර නොදෙන්නෝය. එබැවින් ඔව්හු තමන්ගේ දෙවි ස්වාමින් වහන්සේගේ හඬට කන් නොදුන්, දැනුමැතිකම නොපිළිගත් ජාතියකි. සත්‍යය ඔවුන් තුළ නැත. ඒ සියල්ලම ඔවුන්ගේ මුඛයෙන් අතුරුදහන් වී ඇතැයි කියන්නැ”යි සියලු බලැති සමිඳාණන් වහන්සේ වදාළ සේක.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 95 : 1-2, 6-9

පිළිතුර: ඔබේ සිත් දැඩිකර නොගෙන සමිඳුන්ගේ හඬ ශබ්දයට සවන් දෙන්න.

ගීය:

එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු. අප මිඳූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු. තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු. එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු. අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමන්ගේ සෙනඟය. එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය.

එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!
"පාළුකරයේ මස්සා නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩි කර නොගන්න. එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝය. මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝය."

## සාධුකාරය

නුඹලා කළ නුඹලාගේ සියලු වරද නුඹලා වෙතින් අහක දමා අලුත් සිතක් ද අලුත් මනසක් ද නුඹලාට ම සලසා ගන්න.

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 11 : 14 – 23

### *ඔබගේ පක්ෂයට නොවන්නා මට විපක්ෂ ය.*

වරක් ජේසුස් වහන්සේ ගොළු යක්ෂයකු දුරු කරමින් සිටි සේක. යක්ෂයා දුරුවෙත් ම ගොළු මිනිසා කතා කළේය. සමූහයෝ පුදුම වූහ. එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් කතා කොට, "මොහු යක්ෂයන් දුරු කරන්නේ යක්ෂාධිපති වූ බෙල්සෙබුල්ගේ අනුහසින් ය"යි කීහ. අන් සමහරු උන් වහන්සේ වචනයකින් අල්ලා ගන්න පිණිස ස්වර්ගයෙන් හාස්කමක් උන් වහන්සේගෙන් ඉල්ලූහ. උන් වහන්ස් ඔවුන්ගේ සිතුවිලි දැන මෙසේ වදාළ සේක. 'ඊට ම විරෝධීව භේද වූ යම් රාජයක් ඇද්ද. එය පාළු වන්නේය. ඊට ම විරෝධව භේද වූ යම් ගෙදරක් ඇද්ද එය පිරිහී යන්නේය. සාතන් ඔහුට ම විරෝධීව භේද ව සිටී නම් ඔහුගේ රාජ්‍යය පවතින්නේ කෙසේද? මා යක්ෂයන් දුරු කරන්නේ බෙල්සෙබුල්ගේ අනුහසින් යයි ඔබ කියන්නාහු ය. එහෙත් මම බෙල්සෙබුල්ගේ අනුහසින් යක්ෂයන් දුරු කරම් නම් ඔබගේ අනුගාමිකයෝ කවරෙකුගේ අනුහසින් ඔවුන් දුරු කරත් ද? මෙලෙස ඔබේ අනුගාමිකයෝ ම ඔබේ තර්කය බිඳ දමති. එහෙත් මම දෙවියන් වහන්සේගේ අනුහසින් යක්ෂයන් දුරු කරම් නම් සැබැවින්ම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙහි උදා වී ඇත. අවි ආයුධ ගත් බලවන්තයෙකු සිය නිවස රක්නා කල ඔහු සතු දේපළ සුරක්ෂිතව ඇත. එහෙත් ඔහුට වඩා බලවන්තයෙක් අවුත් ඔහු මැඩ පවත්වන්නේ නම් ඔහු

විශ්වාසය තැබූ ආයුධ පැහැරගෙන කොල්ලකාගත් දේ බෙදා ගන්නේය. මාගේ පක්ෂයට නොවන්නා මට විපක්ෂය. මා සමඟ රැස් කිරීමට උදව් නොකරන්නා විසුරුවා දමන්නේය.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**